## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

## 2024 වර්ෂය සඳහා සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත පහත සඳහන් භාණ්ඩ හා සේවා 2024 වර්ෂය සඳහා සැපයීමට පිළිගත් නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් හෝ ඔවුන්ගේ පත් කළ නියෝජිතයින්, බලයලත් අලෙවිකරුවන් සහ සේවා සපයන්නන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සැළකිය යුතුයි:**

**2022-2024 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට භාණ්ඩ හා සේවා සැපයීම වෙනුවෙන් දැනටමත් 2022 සහ 2023 වර්ෂවලදී ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගේ ලැයිස්තුව බල පැවැත්වෙන අතර එවැනි සැපයුම්කරුවන් නැවත 2024 වර්ෂය සඳහා ලියාපදිංචි වීම අවශ්‍ය නොවේ.**

| අයිතම අංකය | වර්ගය(භාණ්ඩ) | විස්තරය |
|---|---|---|
| 01 | පරිගණක ලිපි ද්‍රව්‍ය මුද්‍රණය | පරිගණක පත්‍රිකා, හර පත්‍රිකා හා අවසර පත්‍ර |
| 02 | පරිගණක. ප්‍රින්ටර් හා උපාංග | ලැප්ටොප්, ඩෙස්ක්ටොප් පරිගණක, ප්‍රින්ටර්, UPS ඒකක, ස්කෑනර්ස් (Scanners), සර්වර්ස්, ජාල ස්විච (Network Switches), රවුටර, USB Pen Drive, බාහිර දෘඪ තැටි (External Hard Disk) සහ වෙබ් කැමරා |
| 03 | පරිගණක ජාල | ජාල ස්ථර කිරීම (Network Layering), පරිගණක ජාල උපකරණ හා උපාංග |
| 04 | විදුලි උපාංග | එක්ස්ටෙන්ෂන් කෝඩ්, විදුලි බල්බ, වයර්, කේබල් සහ විදුලි පංකා |
| 05 | හාඩ්වෙයාර් අයිතම | GI බට, PVC බට, ඇලුමිනියම් උපාංග, ජල මීටර , වැල් වර්ග, ලීඩ් සීල්, ඉනිමං (ladders) |
| 06 | රසායනාගාර උපකරණ හා රසායන ද්‍රව්‍ය | ජලය, අපවිත්‍ර ජලය, වාතය හා අපද්‍රව්‍ය විශ්ලේෂණය සඳහා |
| 07 | කාර්යාලීය ලිපි ද්‍රව්‍ය | පෑන්, පැන්සල්, ඡායාපිටපත් කඩදාසි, ලියන කඩදාසි, බොක්ස් ෆයිල්, ෆයිල් කවර, ස්ටේප්ලර්, පන්චර්, ඇමුණුම් කටු, ප්ලාස්ටික් ෆයිල් කවර, CR පොත්, වයිට් බෝඩ්, ගණක යන්ත්‍ර, පෙන් ටෝච් බැටරි හා අනෙකුත් ලිපි ද්‍රව්‍ය වර්ග |
| 08 | කාර්යාලීය ගෘහ භාණ්ඩ (වානේ/ දැව/ ප්ලාස්ටික්/ පදම් කල දැව) | පුටු, කැබිනට්, කබඩ්, රාක්ක හා කාර්යාලීය මේස |
| 09 | කාර්යාලීය උපකරණ | මුදල් ගණින යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර්, බයින්ඩින් මැෂින්, ෆ්‍රෑන්කින් මැෂින් හා කඩදාසි කැපීමේ යන්ත්‍ර |
| 10 | අභ්‍යන්තර අලංකරණය සහ සිවිල් වැඩ කොන්ත්‍රාත්තු | කොටස් කිරීම (Partitioning), වෙනිසි පැලලි (Venetian Blinds), බුමුතුරුණු ඇතිරීම(Carpenting), විදුලි පරිපථ/ රැහැන් ඇදීම (Electrical/Telephone Wiring), ඇලුමිනියම් පිරිසැකසුම් කරන්නන් (Aluminium Fabricators) සහ ජාලකරනය (Networking) |
| 11 | මුද්‍රණ කටයුතු | වාර්ෂික වාර්තා, කුඩා පොත්, අත් පොත්, පොත් පිංච, පත්‍රිකා, පුවත් පත්‍රිකා, සඟරා, ඩොකට්ස්, කොන්කර් කඩදාසි ලිපි ශීර්ෂ, නාම පත්‍රිකා, අවසර පත්‍ර, රෙජිස්ටර, මුද්‍රිත ලියුම් කවර, N C R කඩදාසි මුද්‍රණ පත් සහ මුද්‍රිත ෆයිල් කවර |

| | | |
|---|---|---|
| 12 | පුද්ගලික සනීපාරක්ෂක නිශ්පාදන (Personal Hygiene Products) | විෂබීජ නාශක දියර, සැනිටයිසර්, පළිබෝධනාශක පාලක සේවා ද්‍රව්‍ය, සබන් සහ ඩිටර්ජන්ට් |
| 13 | ගෘහ භාණ්ඩ | විදුලි කේතල්, ජල ඩිස්පෙන්සර්, වෝටර් ෆිල්ටර්ස්, බොයිලේරු, විදුලි ශීතකරණ සහ රූපවාහිනී යන්ත්‍ර |

| අයිතම අංකය | ප්‍රවර්ගය(භාණ්ඩ) | විස්තරය |
|---|---|---|
| 14 | පරිගණක, ප්‍රින්ටර්ස් සහ උපාංග සඳහා සේවා සැපයීම සහ අලුත්වැඩියා කටයුතු | ලැප්ටොප් සහ ඩෙක්ස්ටොප් පරිගණක, සර්වර්ස්, ප්‍රින්ටර්ස්, ජාල ස්විච (Network Switches), UPS ඒකක, ප්‍රති-වයිරස පැකේජ සහ පරිගණක මෘදුකාංග පැකේජ |
| 15 | වාහන අලුත්වැඩියා සේවා, වාහන අමතර කොටස් සහ උපාංග | වාහන අලුත්වැඩියා කිරීම්, අමතර කොටස්, ටයර්, ටියුබ්, බැටරි සහ අනෙකුත් අවශ්‍යතා |

- ලියාපදිංචිය සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නිල අඩවියෙන් (www.investsrilanka.com) බාගත කරගැනීම හෝ ලෝක වෙළඳ මධ්‍යස්ථානය, බටහිර කුළුණ, 09 වන මහලේ ගබඩා සහ සැපයුම් අංශයෙන් **2023 දෙසැම්බර් මස 22 වන දින ප.ව 03:30** දක්වා ලබා ගත හැක.

- කාණ්ඩ අංක **02, 03, 06, 09 සහ 10** සඳහා නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් හෝ ඔවුන්ගේ පත්කළ නියෝජිතයින්, බලයලත් අලෙවිකරුවන් සහ සේවා සපයන්නන් පමණක් සහ කාණ්ඩ අංක **11 සහ 15** සඳහා සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන් තමන්ගේ අදාළ ක්ෂේත්‍රයන්හි **අවම වශයෙන් වසර තුනක්** මෙහෙයුම් කටයුතු සිදු කොට ඇති නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් හෝ ඔවුන්ගේ පත්කළ නියෝජිතයින්, බලයලත් අලෙවිකරුවන් සහ සේවා සපයන්නන් පමණක් සුදුසුකම් ලබන අතර අත්දැකීම් සනාථ කිරීම සඳහා ලේඛන අමුණා එවන මෙන් ඉල්ලා සිටී. (මිලදී ගැනීමේ ඇණවුම්, ඉන්වොයිසි සහ සේවාලාභී විස්තර). එම අවශ්‍යයතාවය සපුරා නොමැති අය, ඇගයීම සඳහා සලකා බලනු නොලැබේ.

- සියලුම නිෂ්පාදකයින් සහ සේවා සපයන්නන් අවශ්‍ය වෙතොත් ණය පදනම යටතේ මාසයක කාලයක් දක්වා සිය සේවාවන් ලබාදීමට හැකි තත්වයක සිටිය යුතුය.

  සටහන - කාණ්ඩ අංක 02, 03, 06, 08, 09, 10 සහ 12 සඳහා රු. මිලියන 1 ක් දක්වා ණය පහසුකම් ලබා දීමට අවශ්‍ය වන අතර කාණ්ඩ අංක 01, 04, 05, 07, 11, 13, 14 සහ 15 සඳහා රු. 500,000.00 දක්වා ණය පහසුකම් ලබා දීමට අවශ්‍යය.

- එක් එක් කාණ්ඩය සඳහා වසරක් සඳහා ලියාපදිංචි ගාස්තු වශයෙන් ආපසු ගෙවනු නොලබන **රුපියල් 1,000.00 (SSCL බදු සහිතයි) + වැට් බදු** ගෙවිය යුතුය. අදාළ ගෙවීම් කොළඹ 01, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, බටහිර කුළුණ, 08 වන මහලේ, මුදල් දෙපාර්තමේන්තුවේ, සරප් වෙත **2023 දෙසැම්බර් මස 22 වන දින ප.ව 03:30 දක්වා** මුදලින් පමණක් කළ හැක. චෙක්පත් බාර ගනු නොලැබේ.

- අයදුම්පත් හා ලදුපත බහාලූ කවර "**සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම- 2024 වර්ෂය**" යනුවෙන් වම් ඉහළ කෙළවරේ සඳහන් කොට, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ(පරිපාලන), පරිපාලන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, 09 වන මහල, බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01 යන ලිපිනයට **2023 දෙසැම්බර් මස 29 වන දිනට** හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට කටයුතු කල යුතුය.

**සභාපති**
**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**